**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister – 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary – 2784812

කාර්යාලය / அலுவலகம் / Office – 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ........................................

චක්‍රලේඛ අංකය : 2006/09

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

[illegible] කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. ED/01/12/06/15/01

දිනය / திகதி / Date 2006.03. 07

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත.

## ද්විතියික ශ්‍රේණි (6 – 11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

පාසල් විෂයමාලාව කාලීන අවශ්‍යතා අනුව වෙනස් විය යුතු වේ. එබැවින්, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ ද නිර්දේශ මත වර්ෂ 2007 සිට මෙම චක්‍රලේඛය ප්‍රකාර විෂයමාලා සංශෝධන හඳුන්වා දීමට තීරණය කර තිබේ.

අංක.2005/30 දරන හා 2005.09.28 දිනැති " ද්විතියික ශ්‍රේණි (6-11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම " චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

මෙම චක්‍රලේඛයේ දක්වන නියමයන්ට අනුව 2007 වසරේ 6 හා 10 ශ්‍රේණි සඳහා ද 2008 වසරේ 7 හා 11 ශ්‍රේණි සඳහා ද 2009 වසරේදී 8 වන ශ්‍රේණිය සඳහා ද 2010 දී 9 වන ශ්‍රේණිය සඳහා ද මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලැබේ. තව ද පැරණි විෂයමාලාව (99/45 චක්‍රලේඛය හා එහි සංශෝධන) 2007 වර්ෂයේ දී 7, 8, 9 හා 11 ශ්‍රේණි සඳහා ද 2008 වර්ෂයේ දී 8 හා 9 ශ්‍රේණි සඳහා ද 2009 වර්ෂයේ දී 9 වන ශ්‍රේණි සඳහා ද බලපැවැත්වේ. එය පහත සඳහන් වගුව මගින් ද ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|
| 2007 | NS | OS | OS | OS | NS | OS |
| 2008 | NS | NS | OS | OS | NS | NS |
| 2009 | NS | NS | NS | OS | NS | NS |
| 2010 | NS | NS | NS | NS | NS | NS |

NS - නව විෂයමාලාව (2006/09 ට අනුව)
OS - පැරණි විෂයමාලාව (1999/45 ට අනුව)

ඉහත සඳහන් පරිදි පාසල් කාලසටහන සකස් කර ගත යුතු අතර 2010 වර්ෂයේ දී සියලු ම ද්විතියික ශ්‍රේණි සඳහා මෙම චක්‍රලේඛය අනුව පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ. 2007 සිට පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන මෙම නව විෂයමාලාව හදාරන සිසුන් ප්‍රථම වතාවට 2008 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිනු ඇත.

/......02

## 2.0 කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණි (6 – 9)

කනිෂ්ඨ ද්විතියික අංශයේ ශිෂ්‍යයන් විසින් හදාරනු ලැබිය යුතු විෂයයන් හා ඒ සඳහා වෙන් කළ යුතු කාලච්ඡේද සංඛ්‍යාව පහත දැක්වේ.

### 2.1 විෂයයන් සඳහා කාලච්ඡේද වෙන් කළ යුතු ආකාරය (සතියකට)

| අංකය | විෂයය | සතියකට වෙන්වන කාලච්ඡේද | | | |
|---|---|---|---|---|---|
| | | 6 ශ්‍රේණිය | 7 ශ්‍රේණිය | 8 ශ්‍රේණිය | 9 ශ්‍රේණිය |
| 01 | ආගම {බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි/ඉස්ලාම්} | 2 | 2 | 2 | 2 |
| 02 | සිංහල භාෂාව හා සාහිත්‍යය /දෙමළ භාෂාව හා සාහිත්‍යය | 5 | 5 | 5 | 5 |
| 03 | ඉංග්‍රීසි | 5 | 5 | 5 | 5 |
| 04 | ගණිතය | 5 | 5 | 5 | 5 |
| 05 | විද්‍යාව | 5 | 5 | 5 | 5 |
| 06 | ඉතිහාසය | 2 | 2 | 2 | 2 |
| 07 | භූගෝල විද්‍යාව | 2 | 2 | 2 | 2 |
| 08 | ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | 2 | 2 | 2 | 2 |
| 09 | * සෞන්දර්ය විෂයයක් | 3 | 3 | 3 | 3 |
| 10 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | 3 | 3 | 3 | 3 |
| 11 | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | 2 | 2 | 2 | 2 |
| 12 | දෙවන භාෂාව ලෙස සිංහල/දෙමළ | 2 | 2 | 2 | 2 |
| 13 | පුස්තකාල භාවිතය | 1 | 1 | 1 | 1 |
| | ♦ වෙන් නොකරන ලද කාලච්ඡේද | 1 | 1 | 1 | 1 |
| | එකතුව | 40 | 40 | 40 | 40 |

* සෞන්දර්ය විෂයයන් යටතට අයත් වනුයේ අංක 3.2.2 හි සඳහන් විෂයයන් ය.

♦ වෙන් නොකරන ලද කාලච්ඡේදය විදුහලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විෂයයන්, අධ්‍යයන කාර්යයන් සහ ක්‍රීඩා සාහිත්‍ය සංගම් වැනි විෂයය සමගාමී කටයුතු සඳහා යොදා ගත හැකි ය.

## 3.0 ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණි (10 – 11)

නව විෂයමාලාව හර විෂයයන් හා කාණ්ඩ විෂයයන් යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය. හර විෂයයන් 06යි. කාණ්ඩ විෂයයන් කාණ්ඩ 03ක් යටතේ ගොනු කර ඇති අතර එම කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයකින් එක් විෂයයක් බැගින් විෂයයන් 03ක් තෝරා ගත යුතු වේ. මේ අනුව සියලු ම ශිෂ්‍යයන් විසින් හර විෂයයන් 06ක් හා කාණ්ඩ විෂයයන් 03ක් ඇතුළු ව විෂයයන් 09ක් හදාරනු ලැබිය යුතු වේ.

### 3.1 හර විෂයයන්

සියලු ම සිසුන් මෙම විෂයයන් 06 ම හැදෑරිය යුතු යි.

1. ආගම {බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි/ඉස්ලාම්}
2. සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය
3. ගණිතය
4. ඉංග්‍රීසි
5. ඉතිහාසය
6. විද්‍යාව

/..... 03

### 3.2 කාණ්ඩ විෂයයන්

පහත සඳහන් විෂයය කාණ්ඩයන්ගෙන් එක් කාණ්ඩයකින් එක් විෂයයක් පමණක් තෝරා ගත යුතු ය.

#### 3.2.1 පළමු විෂය කාණ්ඩය

1. භූගෝල විද්‍යාව
2. පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය
3. ව්‍යවසායකත්ව අධ්‍යයනය
4. සම්භාව්‍ය භාෂා හා නූතන භාෂා (පාලි/සංස්කෘත/ප්‍රංශ/ජර්මන්/හින්දි/ජපන්/අරාබි)
5. දෙවන භාෂාවක් ලෙස සිංහල/දෙමළ

#### 3.2.2 දෙවන විෂය කාණ්ඩය

1. සංගීතය (පෙරදිග/අපරදිග/කර්ණාටක)
2. චිත්‍ර
3. නැටුම් (දේශීය/භාරතීය)
4. නාට්‍ය හා රංග කලාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
5. සාහිත්‍ය රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/අරාබි)

#### 3.2.3 තෙවන විෂය කාණ්ඩය

1. තොරතුරු සන්නිවේදන තාක්ෂණය
2. කෘෂි හා ආහාර තාක්ෂණය
3. ධීවර හා ආහාර තාක්ෂණය
4. නිර්මාණකරණය හා තාක්ෂණවේදය
5. ශිල්ප කලා
6. ගෘහ ආර්ථික විද්‍යාව
7. විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය
8. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
9. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

### 3.3 විෂයයන් සඳහා කාලච්ඡේද වෙන් කළ යුතු ආකාරය (සතියකට)

| අනු අංක | විෂයය | සතියකට වෙන් වන කාලච්ඡේද | |
|---|---|---|---|
| | | 10 ශ්‍රේණිය | 11 ශ්‍රේණිය |
| 01. | ආගම {බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය/ශෛවනෙරි / ඉස්ලාම්} | 2 | 2 |
| 02. | සිංහල භාෂාව හා සාහිත්‍ය/දෙමළ භාෂාව හා සාහිත්‍ය | 5 | 5 |
| 03. | ගණිතය | 6 | 6 |
| 04. | ඉංග්‍රීසි | 5 | 5 |
| 05. | ඉතිහාසය | 3 | 3 |
| 06. | විද්‍යාව | 6 | 6 |
| 07. | පළමු වන විෂයය කාණ්ඩයේ විෂයයක් | 3 | 3 |
| 08. | දෙවන විෂයය කාණ්ඩයේ විෂයයක් | 3 | 3 |
| 09. | තෙවන විෂයය කාණ්ඩයේ විෂයයක් | 3 | 3 |
| 10. | පුස්තකාල භාවිතය | 1 | 1 |
| | ♦ වෙන් නොකරන ලද කාලච්ඡේද | 3 | 3 |
| | එකතුව | 40 | 40 |

වෙන් නොකරන ලද කාලච්ඡේද 03 න් එක් කාලච්ඡේදයක් ශාරීරික අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතු අතර ඉතිරි කාලච්ඡේදය විදුහලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විෂයයන්, අධ්‍යයන චාරිකා සහ ක්‍රීඩා සාහිත්‍ය සංගම් වැනි විෂයය සමගාමී කටයුතු සඳහා යොදා ගත යුතු ය.

(.......04

**4.0.** 4.1 මෙම පංතිවල ඉගැන්වීමේ දී විෂය නිර්දේශයන්හි දක්වා ඇති අයුරින් හා අදාළ උපදෙස්වලට අනුකූල වන පරිදි ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් භාවිතය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

4.2 මෙම චක්‍රලේඛයේ සඳහන් විෂයයන්ට අදාළ ව විෂය නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සකස් කෙරේ. එම විෂයයන්ට අදාළ පෙළපොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් අදාළ වසරට පෙරාතුව පාසල්වලට ලබා දීමට කටයුතු කරනු ඇත.

4.3 6–11 දක්වා ශ්‍රේණිවල විෂයයන් සඳහා සතියකට වෙන් කර ඇති කාලච්ඡේද අනුව හා නියමිත දෛනික වැඩසටහන් (විශේෂයෙන් ශරීර සුවතා වැඩසටහන් ද) ඇතුළු ව කාලසටහන සකස් කර ඒ අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

1. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - දැ.ගැ.ස.
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂම - දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - අවශ්‍ය කටයුතු සඳහා
4. විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා